සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

29 | S | I

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

## Third Term Test - Grade 1 - 2016

විභාග අංකය ............................. **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I** කාලය පැය දෙකයි

වැදගත්

මෙම ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න 50 ක් ඇත. එම ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු, සපයා ඇති කඩදාසියෙහි ලකුණු කරන්න.

(1) සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර සමීප සම්බන්ධතාවයක් ගොඩනැගෙන්නේ,

1. ප්‍රතිපෝෂණය මගිනි 2. පණිවිඩය මගිනි. 3. ප්‍රතිචාර මගිනි. 4. බලපෑම මගිනි. 5. බාධක මගිනි.

(2)




(B) මෙහි A = සන්නිවේදකයා M = පණිවිඩය B =ග්‍රාහකයා ලෙස දැක්වෙන්නේ නම්,

ඉහත රූප සටහනේ දැක්වෙන සන්නිවේදන ස්වභාවය වන්නේ,

1. සන්නිවේදනයේ ද්වි - මාර්ගික බවයි 2. සන්නිවේදක කේන්ද්‍රීය ස්වභාවයයි.
3. ග්‍රාහක කේන්ද්‍රීය ස්වභාවයි 4. ග්‍රාහකයාට සන්නිවේදන ක්‍රියාවලිය ඇහිරී ඇති බවය.
5. සන්නිවේදනයේ ඒකමාර්ගික බවයි.

(3) රූපවාහිනියේ ප්‍රචාරය වන බොහෝ නාට්‍යවල චරිතවලට ජංගම දුරකතන සහ ඊට අදාළ තාක්ෂණික සන්නිවේදන උපකරණ ආකර්ෂණීය ලෙස භාවිතා කරන ආකාරය විශාල වශයෙන් අන්තර්ගත කර තිබේ. මෙය එම භාණ්ඩ කෙරෙහි ප්‍රේක්ෂකයා,

1. සෘජු පෙළඹවීමකට ලක් කිරීමකි.
2. වක්‍ර පෙළඹවීමකට ලක් කිරීමකි.
3. අත්‍යවශ්‍ය සන්නිවේදන මෙවලමක් ලෙස භාවිතා කිරීමකි.
4. සමාජය තුළ හොඳ සන්නිවේදන සබඳතාවයක් ඇති කිරීමකි.
5. පහසු ජීවන ක්‍රමයකට හුරු කරවීමකි.

(4) පහත සඳහන් අවස්ථා අතරින් අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයට අයත් වන්නේ,

A - දරුවකු තනිව කතාකිරීම සහ හැඬීම. B - කොළයක් පුරා කුරුටුගෑම.
C - දුරකථනයෙන් තම මවට කථා කිරීම. D - රැස්වීමක් ඇමතීම.
E - තම ඔරලෝසුවෙන් වෙලාව බැලීම.

1. A,B හා C පමණි. 2. A,B හා E පමණි. 3. C,D හා E පමණි.
4. D,E හා A පමණි. 5. B,C හා D පමණි.

(5) ස්ව සංකල්පය පිළිබඳ සත්‍ය වන්නේ,

1. පුද්ගලයකු පෙර ආත්මයක සිට ගෙන එනු ලබන අත්දැකීම් සමුදායකි.
2. පුද්ගලයන් සමූහයක් එක්ව ගොඩනගා ගන්නා කතිකාවකි.
3. උපතින් මිනිසා සතු වන්නකි.
4. පුද්ගලයා පරිසරය හා ගැටීමෙන් ලබන අත්දැකීම් අනුව ගොඩනගා ගනු ලබන්නකි.
5. දැනුම හා අත්දැකීම් මත වැඩිදියුණු වන්නකි.

(6) ගුවන්විදුලි ශිල්පීන්ගේ කථන විලාශයේ ආකර්ෂණීය භාවයට බලපෑමක් වන්නේ,

1. සරල භාෂාවක් භාවිත කිරීම.
2. වචන උච්චාරණය විධිමත් වීම.
3. සමීප භාවයෙන් තොර ආගන්තුක බවක් හඬෙහි වීම.
4. පරිකල්පනීය භාෂාවක් භාවිතා කිරීම.
5. වැඩසටහනට අනුව කථන විලාශය සකස් කරගැනීම.

(7) පුවත්පත් වාර්තාකරුවකු විසින් ඉදිරිපත් කළ ලිපියක අන්තර්ගත වූ වාක්‍ය කිහිපයක් පහත දැක්වේ. ඒ අතරින් සංශෝධනයට ලක් කළ යුතු වාක්‍ය වන්නේ,

1. පොලීසිය විසින් උද්ඝෝෂණකරුවෝ මර්දනය කරන ලදී.
2. නිලධාරීන් අකටයුතුකම් කරති'යි විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ ප්‍රකාශ කළහ.
3. කැඳවුම්කරු සිසුන් වෙනුවෙන් උසාවියට පෙනී සිටියේය.
4. සමහරෙක් පොලිසියේ අත් අඩංගුවට පත්වූහ.
5. ශිෂ්‍යයෝ මහා මාර්ගය මුළුමුනින්ම අවහිර කළහ.

(8) සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. කැප කිරීම සහ දරාගැනීම තුළින් සහජීවනය ළඟා කරගත හැකිය.
2. මාධ්‍ය ප්‍රචණ්ඩත්වය ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට හේතු වේ.
3. සහජීවනය බිඳවැටුණු සමාජයක ළමා හා කාන්තා අයිතිවාසිකම්වලට හානි පැමිණේ.
4. ගෘහස්ථ සමාජීය ගැටලු ජනමාධ්‍ය තුළින් ප්‍රති නිර්මාණය වීම සහජීවනය රැකගැනීමට උපකාරයකි.
5. සන්නිවේදනය සඳහා පොදු භාෂාවක් තිබීම සහජීවනයට හේතුවකි.

(9) ඥාන ගවේෂණයේ කාර්යයක් නොවන්නේ,

1. සංජානනයයි. 2. නියෝජනයයි. 3. සංකල්ප විනිශ්චයයි. 4. නිරීක්ෂණයයි. 5. නියාමනයයි.

(10) පුද්ගලයා තුළ ප්‍රචන්ඩත්වය රසවිඳීමේ මානසිකත්වයක් ඇතිවන්නේ,

A - ඒ ප්‍රචණ්ඩත්වයේ ඇති ආකර්ෂණීය බව නිසාය.
B - ප්‍රචණ්ඩත්වයේ ව්‍යාපාරික අරමුණු තේරුම්ගත නොහැකි වන නිසාය.
C - ග්‍රාහකයා තුළ විශ්ලේෂණාත්මක මෙන්ම උසස් වින්දනීය හැකියාවන් නොපවතින නිසාය.
D - ප්‍රචණ්ඩත්වය ගැටුම් නිරාකරණයේ පිළියමක් නිසාය.
E - ප්‍රචණ්ඩත්වය මාධ්‍යයෙන් ප්‍රතික්ෂේප කිරීම නිසා ඇතිවන කුතුහලය නිසාය.

ඉහත ප්‍රකාශ අතරින්,

1. A හා B පමණක් සත්‍ය වේ.
2. A,B හා C පමණක් සත්‍ය වේ.
3. B,C හා D පමණක් සත්‍ය වේ.
4. A,D හා E පමණක් සත්‍ය වේ.
5. A,C හා E පමණක් සත්‍ය වේ.

(11) ''සන්නිවේදනය යනු මිනිසාගේ තෙවන ශ්‍රවණ ඉන්ද්‍රියයි.'' යනුවෙන් දැක්වූයේ,

1. මහාචාර්ය විල්බර් ශ්‍රාම් ය.  2. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.
3. ඩේවිඩ් කෙනත් බර්ලෝ ය.  4. තෝමස් එම්. ස්ටේයින් හැට් ය.
5. ජේ. එල්ඩන් හයිබර්ට් ය.

(12) ජනමාධ්‍ය සැම විටම රජු හෝ යම් බල කණ්ඩායමක් යටතේ ක්‍රියාත්මක වීම තුළ දැකිය හැක්කේ,

1. ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයකි  2. අධිපතිවාදී ලක්ෂණයකි.
3. දේශපාලනික අස්ථාවරභාවයේ ලක්ෂණයකි.
4. දේශපාලනික ස්ථාවරත්වය සුරක්ෂිත කර ගැනීමට දරණ උත්සාහයකි.
5. සමාජ වගකීම් සංකල්පයේ ලක්ෂණයකි.

(13) අ.පො.ස. (සා.පෙළ) විභාගය අසමත් වූ කමනි ඒ පිළිබඳව කල්පනා කරමින් දින ගණනාවක් නිවස තුළට වී සිටියාය. දුර්වල මනසකින් යුතු ඇයට ඇතිවීමට ඉඩ ඇති සරල මාසික පීඩාව වන්නේ,

1. ආතතියයි.  2. ක්ලමතයයි.  3. කාංසාවයි.  4. විශාදයයි.  5. වික්ෂිප්තතාවයි.

(14) පුද්ගලයකු වාහනයකින් පටවාගෙන ආ අපද්‍රව්‍ය තොගයක් සුන්දර වෙල්යායක් අසල ඇති ඇල මාර්ගයකට මුදාහරිනු දුටු විශ්ව විද්‍යාල සිසුවකු වූ සුරංග, එය තම ජංගම දුරකථනයෙන් පටිගත කර එම වීඩියෝ පටය ජනමාධ්‍ය ආයතන කිහිපයකට ලබා දුන්නේය. එය එක් නාලිකාවක රාත්‍රී පුවත් විකාශයේ සුවිශේෂී පුවතක් විය. සුරංගගේ මෙම ක්‍රියාකලාපය හැඳින්විය හැක්කේ,

1. විරෝධාකල්ප මාධ්‍යය භාවිතය ලෙසයි.  2. විකල්ප මාධ්‍ය ප්‍රවණතාවක් ලෙසයි.
3. නව මාධ්‍ය වාර්තාකරණය ලෙසයි.  4. පුරවැසි මාධ්‍යවේදය ලෙසයි.
5. ජනමාධ්‍යවේදියකුගේ තොරතුරු වාර්තාකරණය ලෙසයි.

(15) සන්නිවේදන නියාමනය සිදු නොවන ක්‍රියාවලිය හෝ ක්‍රියාවලීන් තෝරන්න.

A - විකල්ප හා විරෝදාකල්ප පුවත්පතක් විසින් අගමැතිතුමා මෑත දී කළ ප්‍රකාශයේ යථාර්ථය පැහැදිලි කිරීම.
B - සමාජ ජාලවලින් සිදුවන අයථා ක්‍රියා වැළැක්වීමේ පියවරක් ලෙස රජය නව නීති සකස් කිරීම.
C - රාත්‍රියේ පැය 1 ක් හෝ ඊට වැඩි කාලයක් තුළ රූපවාහිනී නාට්‍ය නරඹන පිරිස පිළිබඳ සමීක්ෂණයක් කිරීම.
D - දිගින් දිගටම දිවයින තුළ විභාග ප්‍රතිඵල අඩුවෙමින් පැවතීම පිළිබඳ සාකච්ඡා කිරීම.
E - මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රම පිළිබඳව මාධ්‍ය වැඩමුලු පැවැත්වීම.

1. A පමණි.  2. A හා B පමණි.  3. C හා D පමණි.  4. C පමණි.  5. C හා D පමණි.

(16) වාත්තුකරන ලද සංවිධාවලට අයත්වන්නේ,

A - දිවා සුරකුම් මධ්‍යස්ථාන  B - ජාතික පාසල්
C - දිසා රෝහල්  D - අවමංගල්‍යාධාර සමිති.
E - වැඩිහිටි නිවාස

1. A හා D ය.  2. B හා C ය.  3. A,B හා C ය.  4. A,B හා E ය.  5. A,D හා E ය.

(17) පහත සඳහන් පණිවිඩ වලින් 'ශක්ති ජනක' සංදේශ වලට අයත් වන්නේ,

A - උසස්පෙළ විභාගයට පෙනී සිටින දරුවන්ට ගුවන් විදුලියෙන් උපදෙස් මාලාවක් ලබා දීම.

B - දොරමඩලාව වැඩසටහනක් තුළ පර්යේෂණාත්මක සරල ගීත එකතුවක් ඉදිරිපත් කිරීම.

C - ඉරිදා දිනයක උදෑසන 8.00 ට රූපවාහිනී නාලිකාවක් මගින් ධර්ම දේශනයක් පැවැත්වීම.

D - වාහනයක් ලබා ගැනීමට ණය ලබා ගැනීම සහ වාරික ගෙවන ආකාරය පිළිබඳ නිතර වෙළඳ දැන්වීමකින් ප්‍රචාරය කිරීම.

E - පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරුන්ගේ ආවේගශීලී හැසිරීම් පිළිබඳව මාධ්‍ය වැඩසටහනක දී ජනාධිපතිතුමා තම අප්‍රසාදය ප්‍රකාශ කිරීම.

1. A හා B පමණි. 2. C හා D පමණි. 3. A,B හා E පමණි.

4. A,B හා C පමණි. 5. A,B,C,D හා E යන සියල්ලම.

(18) ජනප්‍රිය සංස්කෘතිය සම්බන්ධ නිවැරදි ප්‍රාකාශය වන්නේ,

1. ජනප්‍රිය සංස්කෘතිය සමාජ සාරධර්ම සමග බැඳී පවතියි.
2. ජනප්‍රිය සංස්කෘතිය වාණිජ නිෂ්පාදනයන් සමඟ බැඳී පවතියි.
3. ජනප්‍රිය සංස්කෘතිය නිසා ජාතික සංස්කෘතිකාංග ඇගයුමට ලක්වේ.
4. ජනප්‍රිය සංස්කෘතිය තුළ පාරිභෝගිකයා ස්වාධීනව භාණ්ඩ හා සේවා තෝරා ගනියි.
5. ජනප්‍රිය සංස්කෘතිය අනියම් ආකාරයෙන් දරුවන් අධ්‍යාපනය වෙත පොළඹවයි.

(19) 1971 දී ආරම්භ කළ ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ,

1. ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේය. 2. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේය.
3. නිවාස සංවර්ධන අධිකාරිය යටතේය. 4. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව යටතේය.
5. ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේය.

(20) ''මුළු මානව සංහතියම ඒකීය සමස්ථ සමාජයක් බවට පත්කර තිබේ'' මෙම අදහසට නොගැලපෙන වගන්තිය වන්නේ,

1. සංවෘත රාජ්‍යයන් හි සංවෘත භාවය කෙළවරට පැමිණ ඇති බවයි.
2. ජාතික රාජ්‍යවල අනන්‍යතාව නැතිවී තිබෙන බවයි.
3. මුළු මානව සමාජය තුළම ඒ ඒ සංස්කෘතීන්ගේ අනන්‍යතාව ගිලිහී ඇති බවයි.
4. විඥාපන ප්‍රාග්ධනය ඒකාධිකාරයක් බවට පත්වී ඇති බවයි.
5. ගෝලීයකරණය ජාතික සංස්කෘතීන්ට අභියෝගයක් නොවන බවයි.

(21) පුද්ගලයකුට බුද්ධිමත්ව තීරණ ගැනීමට ප්‍රධාන වශයෙන්ම හේතු වන්නේ,

1. ඔහු සතු වාග් කෝශයේ පොහොසත් බවයි. 2. සමාජ සම්බන්ධතාවල ප්‍රබල බවයි.
3. සන්නිවේදන මෙවලම්වල ප්‍රමාණාත්මක බවයි. 4. තොරතුරු සහ අත්දැකීම්වල විශාලත්වයයි.
5. අධ්‍යාපන සහතික ප්‍රමාණය වැඩිවීමයි.

(22) ඉහළ මතකයක් ඇති කර ගැනීමට පුණරීක්ෂණය ඉතා වැදගත් නිසා ප්‍රශස්ථ මතකයක් සඳහා වඩාත්ම සාර්ථක ක්‍රමය වන්නේ,

1. නිහඬව පාඩම කියවාගැනීමයි. 2. උගන්වන විට පාඩම හොඳින් අසා සිටීමයි.
3. සටහන් කියවමින් කෙටි සටහන් සකස් කර නැවත මුල් සටහන් හා සසඳා බැලීමයි.
4. පාඩම කියවා ඊට සම්බන්ධ ගැටලු තෝරා ගැනීමයි.
5. සටහන හඬ ගා කියවීමයි.

(23) ගාන්ධිතුමාගේ සංවර්ධන සන්නිවේදන භාවිතය තුළ 'ඓතිහාසික රාම රාජ්‍යය' හඳුන්වන්නේ,

1. ධර්මිෂ්ට හින්දු රාජ්‍යයක් ලෙසය. 2. දිව්‍යමය දේව රාජ්‍යයක් ලෙසය.
3. අවිහිංසාවාදී රාජ්‍යයක් ලෙසය. 4. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ලෙසය.
5. බුද්ධිමතුන්ගේ රාජ්‍යයක් ලෙසය.

(24) නිර්මාණාත්මක සන්නිවේදනයේ දී නිවැරදි වන්නේ,

1. නිර්මාණකරණය මෙන්ම එය ග්‍රහණය කර ගැනීම පුද්ගලබද්ධ වේ.
2. එදිනෙදා පෞද්ගලික ජීවිතයේ සිදුවීම් නිර්මාණකරණයට තේමා කර නොගනී.
3. නිර්මාණකරණය සංවර්ධනාත්මක පණිවිඩ සඳහා සුදුසු නොවේ.
4. ආගමික සිද්ධාන්ත නිරූපනය කළ නොහැක.
5. සමාජය විවරණය කිරීමට නිර්මාණාත්මක සන්නිවේදනයට හැකියාවක් නැත.

(25)  මෙහි සඳහන් සංවර්ධන සන්නිවේදන රූප සටහනෙන් දැක්වෙන්නේ,

1. රජය විසින් මහජනයාට සහනාධාර ලබා දෙන ආකාරයයි.
2. රජය විසින් ප්‍රාදේශීය මට්ටමෙන් ජනතාවගෙන් බදු අයකරගන්නා ආකාරයයි.
3. සංවර්ධන කටයුතු වලට කුඩා කණ්ඩායම් ලෙස එකතුවන ජනතාව රජය සමග බැඳී සිටින ආකාරයයි.
4. ජාතික සංවර්ධනයට දේශීය විදේශීය ආයෝජන වලින් මුදල් ප්‍රතිපාදන ලබාගන්නා ආකාරයයි.
5. දැවැන්ත ජාතික සංවර්ධන වැඩසටහනක් ප්‍රධාන නගර අතර ව්‍යාප්ත කරන ආකාරයයි.

(26) ගීතයක් රසවිඳිමින් සිටි යෙහෙළියන් තිදෙනෙකුගේ අදහස් පහත දැක්වේ.

A - ''ගීතය ඇහෙන කොටම මම හිතුවා ඒ නම් මහගමසේකරයන්ගේ රචනයක් කියලා''

B - ''මහගමසේකරගේ පදමාලාව හොඳටම ගැලපෙන්නේ අමරදේවයන්ගේ ගායනයටයි.''

C - ''මහගමසේකරයන් ඔය තරම් වටිනා නිර්මාණයක් බිහිකළේ , නිරන්තර සතතාභ්‍යාසය තුළින් කියලයි මට හිතෙන්නේ.''

මෙම ප්‍රකාශ වලින් පැහැදිලිවන්නේ, මහගමසේකරයන්ගේ නිර්මාණ තුළ වූ,

1. ග්‍රාහක කේන්ද්‍රීය බවයි. 2. නිර්මාණාත්මක ස්වීත්වයයි.
3. ඉලක්ක ග්‍රාහක පිරිස පිළිබඳ අවබෝධයයි. 4. අර්ථයේ සරල සුගම බවයි.
5. නිර්මාණය කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ කුසලතාවයයි.

(27) යාතුකර්ම සම්බන්ධ නොගැලපෙන වැකිය වන්නේ,

1. ශාන්තිකර්ම හා බලිතොවිල් යහපත සඳහා පවත්වයි.
2. සූනියම්, අණවිණ - කොඩිවින අයහපත සඳහා භාවිතා කරයි.
3. යාතුකර්ම පදනම් වී ඇත්තේ ගුප්ත හා අදෘශ්‍යමාන විශ්වාස මතයි.
4. කොහොඹා කංකාරිය , යක්නැටුම්, අලුත් සහල් මංගල්‍යය යාතුකර්ම වලට අයත් නොවේ.
5. යාතුකර්ම ආශ්‍රිතව නිර්මාණාත්මක සාහිත්‍යයක් පවතියි.

(28) චීන සංවර්ධන සන්නිවේදන ක්‍රියාවලියේ උදානපාඨය වූයේ,

1. ඉහළ සිට පහළට සන්නිවේදනය යන්නයි. 2. මධ්‍යම ආණ්ඩුවෙන් මහජනතාවට යන්නයි.
3. රජයට කුඩා කණ්ඩායම් වලින් යන්නයි. 4. මහජනයාගෙන් මහජනයාට යන්නයි.
5. සමාජවාදී රාජ්‍යයක් සඳහා යන්නයි.

(29) නිර්මාණාත්මක සන්නිවේදනයේදී නිර්මාණකරුවෙකුට ඔහුටම ආවේනික අනන්‍යතාවක් පවත්වාගත හැක්කේ, ප්‍රධාන වශයෙන්,

1. ඔහු තුළ ඇති අනුකරණය හා සාක්ෂරතා හැකියාව මතයි.
2. ග්‍රාහක සංජානනය සහ නිර්මාණකරුගේ අනුකරණය මතයි.
3. ඔහු අයත් සංස්කෘතියේ බලපෑම සහ ආර්ථික ශක්තිය මතයි.
4. නිර්මාණකරු සතු ප්‍රතිභාව සහ පරිකල්පනය මතයි.
5. ග්‍රාහක ස්වරූපය සහ ග්‍රාහක මනස උද්දීපනය කළ ආකාරය මතයි.

(30) සංවර්ධන සන්නිවේදනය සඳහා දෙපියවර ආකෘතියක් හඳුන්වා දෙනු ලැබුවේ,
1. හැරල්ඩ් ඩී. ලැස්වෙල් විසිනි. 2. පෝල් ලසාර්ෆීල්ඩ් විසිනි. 3. ක්ලෝඩ් ෂැනොන් විසිනි.
4. එඩ්වඩ් ෂැපීර් විසිනි. 5. පෝල් පී ස්ටීවන් විසිනි.

(31) වර්ථමාන සමාජය තුළ ජනයා බටහිර සංස්කෘතිකාංග උසස් ලෙස ආරෝපණය කර ගැනීමටත් ජාතික මතවාද බැහැර කිරීමටත් පෙළඹී සිටින්නේ,
1. දේශීය ජාතික මතවාද ග්‍රාම්‍ය වන නිසාය.
2. බටහිර සංස්කෘතිකාංග උසස් සමාජ මට්ටමක් නිර්මාණය කරන නිසාය.
3. බටහිරකරණය පදනම් කරගෙන සංස්කෘතිය ගොඩනැගෙන නිසාය.
4. මාධ්‍ය විසින් බටහිර සංස්කෘතිය සම්ප්‍රේෂණයත් නැගෙනහිර මතවාද බටහිරට සම්ප්‍රේෂණය නොකිරීමත් නිසාය.
5. ජාතික සංස්කෘතිය තුළ දේශීයත්වය හෙළා දකින නිසාය.

(32) 1. ගෝලීයකරණය සමාජයේ සියලු අංශවල ක්‍රියාත්මක වේ.
2. සන්නිවේදනය හරහා ලෝකය පුරාම සමප්‍රමිතියකින් යුත්, සමජාතීය ගෝලීය සංස්කෘතියක් බිහිවෙමින් තිබේ.
3. අනාගතයේ දී බිහිවන තොරතුරු සමාජය තුළ ජාතීන් අතර සහජීවනය වර්ධනය වන බවට මත පලවී තිබේ.
4. ගෝලීයකරණය තුළ මුළු මානව සංහතියම ඒකීය සමාජයක් බවට පත්වෙයි.
5. ලෝකය පුරාම ජාත්‍යන්තර පරිමාණයෙන් සන්නිවේදන උපාංගත් තොරතුරු හුවමාරු කර ගන්නා මාධ්‍ය ජාලත් පද්ධති ලෙස ව්‍යාප්ත වෙමින් පවතී.

**ඉහත සඳහන් ගෝලීයකරණය සම්බන්ධ වැකි අතරින් ''සන්නිවේදනයේ ගෝලීයකරණය'' යන්න පැහැදිලි වන වගන්තිය තෝරන්න.**

(33) ගැල්ටුංගේ ගැටුම් ත්‍රිකෝණයේ 'ව්‍යුහය' යන්නෙන් දක්වන්නේ,
1. ගැටුමට සම්බන්ධ පුද්ගලයන්ගේ ප්‍රචණ්ඩකාරිත්වයයි.
2. ගැටුමක් නිර්මාණය වීමට බලපාන භෞතික සාධකයයි.
3. ගැටුමට හේතුවන විෂයමූල සාධකයයි.
4. ගැටුම් නිර්මාණය කරන මනෝ විද්‍යානුකූල සාධකයයි.
5. ගැටුමකට හේතුවන පුද්ගල අවශ්‍යතා හා සම්බන්ධ සාධකයයි.

(34) 'සංවර්ධන සන්නිවේදන' 'ප්‍රජා මාධ්‍ය' ආකෘතියේ දැකිය හැකි විශේෂ ලක්ෂණයකි.
1. සන්නිවේදකයාට ඍජුවම සංවර්ධන සංදේශය ග්‍රාහකයා වෙත යැවිය හැකි වීම.
2. සංවර්ධන සංදේශය ග්‍රාහකයා වෙත පියවර දෙකකින් ගමන් කරවීම.
3. ඉහළ සිට පහළට සංවර්ධන ඉලක්ක සකස් කිරීම.
4. සන්නිවේදකයා සහ ග්‍රාහකයා අතර සම්බන්ධය අඛණ්ඩව පැවතීම.
5. පහල සිට ඉහළට සංවර්ධන ඉලක්ක සකස් කිරීම.

(35) 1. මාධ්‍ය නිර්මාණයක් තුළ සදාචාරය ආරක්ෂා කිරීම නිර්මාණකරුගේ වගකීමකි.
2. සාමාන්‍ය භාෂා භාවිතයත් මාධ්‍ය නිර්මාණවල භාෂා භාවිතයත් අතර වෙනසක් පවතී.
3. නිර්මාණයක් සෞන්දර්යාත්මක විවරණයකින් පමණක් සමස්ථ විවරණයක යෙදිය නොහැකිය.

ඉහත සඳහන් වාක්‍ය අයත් වන්නේ,

1. සමාජ වගකීම්, නිදහස් මතවාද සහ ප්‍රජාතාන්ත්‍රීකරණ සන්නිවේදන සංකල්පවලටය.
2. සදාචාරාත්මක, භාෂාත්මක සහ සෞන්දර්යාත්මක මාධ්‍ය විචාර ප්‍රවේශයන්ටය.
3. මුද්‍රිත, ගුවන් විදුලි, රූපවාහිනී යන මාධ්‍ය රීතීන්ට ය.
4. සාමය, සහජීවනය සහ පුරවැසි මෙහෙවර යන පුරවැසියෙකු සතු විය යුතු නිපුණතාවලය.
5. සාධාරණත්වය සත්‍යවාදී බව, සහ සංවේදී බව යන මානව ධර්මතාවලටය.

(36) ගැටුමක් උද්දීපනය වීමට හේතුවක් නොවන්නේ,

1. අනවබෝධය. 2. සාධාරණත්වය. 3. ආත්මාර්ථකාමීත්වය.
4. අපේක්ෂාභංගත්වය. 5. අවිශ්වාසය.

(37) භාෂාවේ ලක්ෂණ කිහිපයක් සිසුන් අතර සාකච්ඡාවට ලක්විය.

A. මිනිසා සතු භාෂා නිපුණතා නිසා ඕනෑම දුරක සිදුවූ සිදුවීමක් ප්‍රකාශ කිරීමට හැකියාව තිබේ.
B. මිනිසාට භාෂා භාවිතයෙන් කිසියම් ක්‍රියාවක් විශේෂ කොට ප්‍රකාශ කිරීමේ හැකියාව තිබේ.
C. භාෂාව ශබ්දය හා පද විවිධ සංයෝජන සමග වර නැගීමෙන් එකිනෙකින් වෙන් කර හඳුනාගත හැකිය
D. ප‍ණිවිඩ රූසක් නිර්මාණය කර ගැනීමේ හැකියාව ලබයි.
E. සංස්කෘතිය සම්ප්‍රේෂණය කිරීමට භාෂාවකට හැකිය.

මෙම වාක්‍යවලින් විශේෂීකරණය සහ ද්විත්වතාව යන්න අර්ථවත් වන්නේ,

1. B සහ C 2. A සහ C 3. D සහ E 4. B සහ E 5. A සහ E

(38) ආචාරශීලීත්වය උල්ලංඝනය වූ අවස්ථා තෝරන්න.

A. උදෑසන රැස්වීම අමතන විදුහල්පති තුමාට සාවධානව සවන්දීම.
B. ගුරුතුමිය පංතියේ උගන්වද්දී ශිෂ්‍යයකු විසින් නොතේරෙන කරුණු නැවත අසා ගැනීම.
C. පාර්ලිමේන්තුවේදී මන්ත්‍රීවරයකු සභාගැබ අමතද්දී විපක්ෂයේ මන්ත්‍රීවරු ඝෝෂා කරමින් විරෝධයපෑම.
D.රූපවාහිනී නාලිකාවක මාධ්‍ය සාකච්චාවකට සහභාගී වූ දේශපාලඥයෙකු හදිසියේ රෝගාතුර වී රෝහල්ගත කිරීම.
E. නිවාඩුකාලය අවසන් වී නව වාරය පටන්ගත් මුල් දිනයේ දරුවන් ගුරුවරුන්ට බුලත් දී වැඳීම.

1. B සහ C පමණි. 2. D පමණි. 3. C සහ D පමණි. 4. C පමණි. 5. B,C සහ D පමණි.

(39) පුද්ගලයකු තොරතුරු ලබා ගන්නා ඔහු සතු උපකරණ වන්නේ,

1. ඇස්, කන්, නාසය, දිව, ශරීරයයි. 2. පුවත්පත්, ගුවන්විදුලිය හා රූපවාහිනියයි.
3. පුස්තකාලය, අන්තර්ජාලය, ලේඛනාගාරය. 4. පෝස්ටර්, සඟරා, බැනර්
5. ලිඛිත මූලාශ්‍ර, පුද්ගල මූලාශ්‍ර, විද්‍යුත් මූලාශ්‍ර

(40) නිර්මාණාත්මක සන්නිවේදනයේ අභිප්‍රාය වන්නේ,

1. අත්දැකීම්, හැඟීම්, තොරතුරු හෝ සිතිවිලි අපූර්ව ලෙස ඉදිරිපත් කිරීමයි.
2. සමාජය නිසි ලෙස යථාර්ථවාදීව විවරණය කිරීමයි.
3. සමාජය කෙරෙහි පුද්ගලයා දක්වන ආකල්ප වෙනස් කිරීමයි.
4. මාධ්‍ය සහ සංස්කෘතිය අතර සම්බන්ධතාවය පැහැදිලි කිරීමයි.
5. වැඩවසම්, සමාජවාදී යනාදී සංකල්ප ආශ්‍රයෙන් නිර්මාණකරණයේ මූලාරම්භය සොයා බැලීමයි.

(41) නව මාධ්‍යයක් ලෙස අන්තර්ජාලයෙහි ලක්‍ෂණයක් නොවන්නේ,

1. අනෙකුත් මාධ්‍යයන්ට සාපේක්‍ෂව වේගවත් වීම.
2. ග්‍රාහක අවශ්‍යතාවය මත පුළුල් විෂය පථයක් තුළ තොරතුරු ග්‍රහණය කර ගැනීමේ පහසුව.
3. නිශ්චිත හිමිකාරිත්වයක් සහිත වීම.
4. භූගෝලීය සීමාවන් අතික්‍රමණය කිරීම.
5. ප්‍රකාශයට පත්වූ තොරතුරු කල්ගතවී නමුත් පහසුවෙන් නැවත පරිශීලනය කිරීමේ හැකියාව සහිත වීම.

(42) විරෝධාකල්ප මාධ්‍යයක ලක්‍ෂණයක් නොවන්නේ,

1. ප්‍රධාන මාධ්‍යයට අනුබද්ධිතව පවත්වාගෙන යයි.
2. ලාභ ප්‍රයෝජන පසෙක ලා මතවාදී කාර්යයන් සඳහා පවත්වාගෙන යාම.
3. සමාජ විඥානයෙහි වෙනසක් ඇති කිරීමට හැකි වීම.
4. නව සමාජ හර පද්ධතීන් හා අර්ථ සමාජගත කිරීම.
5. පාරිභෝගිකවාදයට හා ජනප්‍රිය සංස්කෘතියට එරෙහිව ඉදිරිපත් වීම.

(43) භාෂාව පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - භාෂා අභාවයට යාම ගෝලීය වශයෙන් මුහුණ දීමට සිදුව ඇති අර්බුදයකි.

B - භාෂාවක් මළ භාෂාවක් බවට පත්වීමෙන් ඒ හා බැඳී පවතින දැනුම් සම්භාරය මිනිසාට අහිමි වීමක් සිදු නොවේ.

C - භාෂාවක් නිරන්තරව භාවිත කිරීමෙන් එය පෝෂණය වේ. වෙනස්වේ.

D - කලක් අජීව භාෂාවක් බවට පත්ව තිබී පසුව ජීව භාෂා බවට පත්වූ අවස්ථා දක්නට ලැබේ.

ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,

1. A,B හා C පමණි. 2. A,B හා D පමණි. 3. A,C හා D පමණි.
4. B,C හා D පමණි. 5. A,B,C හා D පමණි.

(44) ''සංස්කෘතිය යනු, උපකරණ, පාරිභෝගික ද්‍රව්‍ය, විවිධ සමාජයීය සමූහයන්ගේ ව්‍යුහමය ලක්‍ෂණ, මානව සංකල්පනා, ශිල්ප, විශ්වාස හා චාරිත්‍රයන්ගෙන් අනුබද්ධ සමස්තයයි.'' යනුවෙන් නිර්වචනය කළේ,

1. එඩ්වඩ්. ටයිලර් විසිනි. 2. රැල්ෆ් ලින්ටන් විසිනි. 3. බී. මැලිනොවුස්කි විසිනි.
4. එඩ්වඩ් ෂැපීර් විසිනි. 5. විල්බර් ශ්‍රාම් විසිනි.

(45) කිසියම් ආයතනයක් මහජන සම්බන්ධතා කාර්යයක් ලෙස අනුග්‍රාහකත්වය යොදා ගැනීමේදී,

1. දිගුකාලීන ව්‍යාපෘති සඳහා පමණක් අනුග්‍රාහකත්වය ලබා දේ.
2. එකඟ වූ කොන්දේසි මත ක්‍රියාත්මක වේ.
3. ක්‍රීඩා අධ්‍යාපන හා සෞඛ්‍ය යන අංශ සඳහා පමණක් දායක වේ.
4. මත්පැන් දුම්වැටි නිෂ්පාදකයන්ට ප්‍රමුඛත්වය ලබා දෙයි.
5. මූල්‍ය ප්‍රදානයන් පමණක් සිදුකරයි.

(46) අතිරේක පන්ති පවත්වන ගුරුවරයකුට ඔහුට අවශ්‍ය මහජන කණ්ඩායම සකස්කර ගැනීමට භාවිතයට ගත හැකි සාර්ථකම මෙවලම් සහ විධි වන්නේ,

1. ශ්‍රව්‍ය මාධ්‍ය තුළ ශබ්ද විකාශන යන්ත්‍රයකින් ප්‍රදේශය පුරා පණිවිඩය නිවේදනය කිරීමයි.
2. මුද්‍රිත මාධ්‍යය භාවිත කරමින් අත් පත්‍රිකා පෝස්ටර්, බැනර් භාවිතා කිරීමයි.
3. මුද්‍රිත මාධ්‍ය තුළ සඟරා, ප්‍රදර්ශන පුවරු භාවිත කිරීමයි.
4. ඡායාරූප ප්‍රදර්ශන සහ විශාලනය කළ ඡායාරූප ලබාදීමයි.
5. අතිරේක පන්තිය අවට සහ අභ්‍යන්තර පරිසරය ආකර්ශණය කර ගැනීමට මල් වැවීම සහ බිත්තිවල පින්තූර එල්ලීමයි.

(47) සංස්කෘතික කම්පනයේ ලක්ෂණයක් නොවන්නේ,

1. සංස්කෘතික කම්පනය ගැටුම්කාරී ස්වභාවයකින් ප්‍රකාශිත විය හැකි වීම.
2. වැඩිහිටි - තරුණ අරගලයක් ලෙස ඉදිරිපත් විය හැකි වීම.
3. සංස්කෘතියේ ස්ථාවරභාවය නිසා සංස්කෘතික කම්පනය ඇතිවීම.
4. සංස්කෘතික කම්පනය ඇතිවීමට විරෝධී සංස්කෘතිය හේතු වීම.
5. සමාජයේ එක් කොටසක් නව සංස්කෘතිකාංග භාර ගැනීමත් තවත් කොටසක් නව සංස්කෘතිකාංග ප්‍රතික්ෂේප කිරීමත් සංස්කෘතික කම්පනයට හේතු වීම.

(48) සෑම සිංහල අලුත් අවුරුදු දිනයකම ගනුදෙනු කිරීමේ නැකතට තම පියා සමග ගනුදෙනු කරන සුසන්ත මෙවර ජනමාධ්‍ය තුළින් ප්‍රචාරය කළ ආකාරයට ගනුදෙනු කිරීමට බැංකුවක් තෝරා ගත්තේය. මෙයින් පැහැදිලි වන්නේ,

1. මාධ්‍ය සංස්කෘතිය, සාම්ප්‍රදායික සංස්කෘතියේ සබඳතා උපක්‍රමශීලීව බිඳ හෙලනා බවයි.
2. මාධ්‍ය සංස්කෘතිය විසින් සමාජයේ අනවශ්‍ය චාරිත්‍ර පිළිබඳව නවීන දැනුවත්භාවයක් ඇතිකරන බවයි.
3. අනාගත අපේක්ෂාවන් ලාභය මතම මෙහෙයවන බවයි.
4. නව සමාජ සංස්කෘතියක අවශ්‍යතාවයත්, පැරණි චාරිත්‍ර යල්පැනගිය චාරිත්‍ර බවත් දැක්වීමයි.
5. සංවර්ධනය සඳහා, දේශීය සංස්කෘතිය මාධ්‍ය සංස්කෘතියට පරිවර්තනය කළ යුතු බවයි.

(49) කථනය යනු,

1. වෙනත් පාර්ශවයක් සමග කථාබහ කිරීමකි.
2. භාෂාවේ අර්ථය පැහැදිලි කරවන අවාචිත සංඥා භාවිත කිරීමකි.
3. අනෙක් පාර්ෂවයට ග්‍රහනය කර ගැනීමට තනි පුද්ගලයකු විසින් ඉදිරිපත් කරන කථාවකි.
4. විවිධ ආකෘති යටතේ නිර්මාණ ඉදිරිපත් කිරීමකි.
5. භාෂාව යොදා ගනිමින් සාකච්ඡාවක යෙදීමකි.

(50) පුද්ගලයකුගේ ප්‍රතිරූපය ගොඩනැංවීමට අවශ්‍ය සාධක වන්නේ,

A - පුද්ගලයකුගේ ආචාරශීලී ගති ලක්ෂණ B - පුද්ගලයකුගේ හැසිරීම හා පෙනුම.
C - පුද්ගලයකු සතු ධනය හා බලය. D - පුද්ගලයාගේ ත්‍යාගශීලී භාවය.
E - පුද්ගලයාගේ ඉදිරිපත්වීමේ හා ගැටලුවලට මුහුණදීමේ ස්වභාවය.

1. A,B හා C පමණි. 2. B,C හා D පමණි. 3. B,C හා E පමණි.
4. A,B,C,D හා E යන සියල්ලම. 5. A,C,D හා E පමණි.